සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**මධ්‍ය වාර පරීක්ෂණය 2015**

07 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

කාලය පැය 2 යි.

නම/ විභාග අංකය:

## I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ස්වර සප්තකයේ ඇති අචල ස්වර වන්නේ,

(1) රි, ප (2) ස, රි (3) ස, ප (4) ම, ප

02 කෝමල ස්වරයක් යනු

(1) ශුද්ධ ස්වරයට වඩා හඬ භාගයක් වැඩි වූ ස්වරයයි.

(2) සාමාන්‍ය හඬක් ඇති ස්වරයයි.

(3) ශුද්ධ ස්වරයට වඩා හඬ භාගයක් අඩු වූ ස්වරයයි.

(4) වෙනස්වන ස්වරයයි.

03 වයලින් පවුලේ විශාලම සංගීත භාණ්ඩය වන්නේ,

(1) වියෝලා (2) චෙලෝ (3) ඩබල් බේස් (4) වයලින්

04 ස්වර පුවරුවක කළු යතුරකට අයත් ස්වරයකි

(1) ස (2) රි (underlined) (3) ම (4) ස (with dot above)

05 ශ්‍රී ලංකාවට ආවේනික පිඹීමෙන් හඬ උපදවන භාණ්ඩයකි.

(1) මෙලෝඩිකාව (2) සර්පිනාව (3) මවුත් ඕගනය (4) හොරණෑව

06 ස රි ග - , රි ග ම - , මෙම ස්වර අභ්‍යාසයේ ඊළඟ ස්වර පියවර වන්නේ,

(1) ග ම ප - (2) ම ප ධ - (3) ම ප ග - (4) ග ප ධ -

07 ස ස ග ග | රි රි ග - | ස ස රි රි | ග - - - මෙම ස්වර පේළිය අයත් ස්වර ස්ථාපන ගීතය වන්නේ,

(1) කඳුපෙළ අතරේ තුරු වදුලේ (2) මුනි සිරිපාදේ සමනොළ මුදුනේ

(3) බැතිනා සිරිපා කරුණා කරනා (4) සවන පිනන ගීත මිහිර

08 "#" මෙම සංකේතය බටහිර සංගිතයට අයත්ය. මෙම සංකේතය භාවිතා වන්නේ,

(1) ශුද්ධ ස්වරය සඳහා (2) තිව්‍ර ස්වර සඳහා

(3) මන්ද්‍ර ස්වර සඳහා (4) කෝමළ ස්වරය සඳහා

09 විලම්භලයෙන් ගායනා කරනු ලබන ගීතයක් වන්නේ,

(1) දන්නෝ බුදුන්ගේ (2) මගෙ පොඩි යාලු නෙලමුද ඕලු

(3) ආදරේ ඇයි පොඩි හඳමාමේ (4) ආදරයේ අල්පත වු අම්මා

10 වයලීනයේ තත්

(1) 8 කි. (2) 4 කි. (3) 6 කි. (4) 12 කි.

- **අංක 11 - 15 දක්වා වූ ප්‍රශ්නවල හිස් තැනට සුදුසු පිළිතුර සපයන්න.**

11 තාලයේ කුඩාම ඒකකය ........................................................................................ නම් වේ.

12 සිතාරය වාදනය කරනු ලබන්නේ ...................................................... නමැති අපකරණයෙනි.

13 බටනලාව වාදනයේ දී සියලුම සිදුරු වසා වාදනය කළ විට ලැබෙනුයේ ........................................................... ස්වරයයි.

14 ''එගොඩ ගොඩෙත් රත්තරං'' යන රබන් පදය ගැයෙන්නේ මාත්‍රා ........................................................................ ට ය.

15 බටහිර සංගීතයට අනුව කෝමල ස්වරය හඳුන්වනු ලබන්නේ ................................................................ නමිනි.

- **A හා B ගැලපෙන සේ යාකරන්න.**

| | A | | B |
|---|---|---|---|
| 16 | වන්දනාවේ යන විට ගායනය සිදුවේ. | (i) | වයලීනය |
| 17 | ස්වර වාදනය කළ හැකි සංගිත භාණ්ඩයකි. | (ii) | දරු නැලවිලි ගී |
| 18 | දේශීය තාල වාද්‍ය භාණ්ඩයකි. | (iii) | සර්පිනාව |
| 19 | වින්රෙස්ට් සවුන්ඩ් බොක්ස්, ෆින්ගර් බෝඩ් වැනි කොටස් අයත්වන වාද්‍ය භාණ්ඩය | (iv) | බැති ගී |
| 20 | දයාව, සෙනෙහස හා මුසු වූ ජන ගී විශේෂයකි. | (v) | ගැටබෙරය |

(2 x 20 = 40)

## II කොටස

- **තෝරාගත් ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 (1) සංගීතයට උපයෝගී කරගන්නා සම්පූර්ණ ස්වර ගණන ලියා දක්වන්න. (ල. 06)

(2) පෙරදිග සංගීතයේ භාවිතා වන සම්පූර්ණ ස්වර බටහිර සංගීතයට අනුව Sharp (#) සංකේතය භාවිතා කරමින් ආරෝහණ ක්‍රමයට ගොඩනගන්න. (ල. 06)

02 (1) කෝමල ග, නි සහිත ස්වර ස්ථාපන ගීතයක ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 06)

(2) පහත දක්වෙන ස්වර අභ්‍යාස කෝමල <u>ග</u> , <u>නි</u> යොදමින් ආරෝහණ අවරෝහණ වශයෙන් සම්පූර්ණ කරන්න.

1. සරි<u>ග</u> , රිගම 2. සසස , රිරිරි (ල. 06)

03 (1) වයලීන් පවුල නම් කරන්න. (ල. 02)

(2) වයලීනය පිලිබඳ කරුණු 4 ක් ලියා දක්වන්න. (ල. 08)

(3) වයලීනයේ තත් බටහිර ක්‍රමයට අනුව හඳුන්වන්න. (ල. 02)

04 (අ) අතට වෙරළු ඇහිඳ ගෙනේ
ඉනට පලා නෙලා ගෙනේ
බරටම දර කඩා ගෙනේ
එයි අම්මා විගස කිනේ

(ආ) බුද්ධ ං සරණේ සිරස දරාගෙන
ධම්මං සරණේ සිත පහදාගෙන
සංඝං සරණේ සිවුරු දරාගෙන
ඉඤ්ඤයි තුන් සරණේ අදහාගෙන

(1) ඉහත (අ), (ආ) කොටස්වලට අයත් ගීත වර්ග නම් කරන්න. (ල. 04)

(2) එම ගීත වර්ග දෙක පිළිබඳ කරුණු 4 බැගින් ලියා දක්වන්න. (ල. 04)

(3) (ආ) කොටසට අයත් ගීත වර්ගයට අදාළව වෙනත් ගීතයක් ලියා දක්වන්න. (ල. 04)

05 සුළං හමයි - ගස් නැලවෙයි